# 多言語情報コーナー　（令和８年　７月号）

## 1. තාප ආඝාතය වළක්වා ගැනීම පිලිබඳව.

මෙම වසරේ, සැබවින්ම උණුසුම් කාලය අප වෙත පැමිණ ඇත. ඇතිවන රස්නය වළක්වා ගැනීමට නිතර ජලය පානය කිරීමෙන් විජලනය වීම වලක්වා ගැනීමට වග බලා ගනිමු.

අධික රස්නය මගින් ඇතිවන අපහසුතා වළක්වා ගැනීම සඳහා, වායු සමීකරණය මගින් රස්නය පාලනය කිරීම, කාමරය තුලට පැමිණෙන දැඩි හිරු එළිය වැළැක්වීම සඳහා ජනේල්වල පිටතින් එල්ලන තිර හෝ හිරු ආවරණ භාවිතා කිරීම, ඔබේ නිවස වටා සහ මාර්ගවල ජලය ඉසිම සහ පිටතට යන විට හිරුඑලියෙන් ආරක්ෂා වන කුඩයක් හෝ තොප්පියක් භාවිතා කරන්න.

තාප ආඝාතය ඇති බවට සැක කරන කෙනෙකු ඔබ දුටුවහොත්, ඔවුන් වායුසමීකරණය කළ කාමරයක් තුලට හෝ හොඳින් වාතාශ්‍රය ඇති, සෙවන සහිත ස්ථානයක් වැනි සිසිල් ස්ථානයකට රැගෙන යායුතු අතර ඔවුන්ගේ ඇඳුම් ලිහිල් කර බෙල්ල, කිහිලි සහ ඉකිලි සිසිල් කරන්න. එසේම, ප්‍රතිජලකරණ පානයක් හෙවත් (ORS)පානයක් ලබාදීම. ඔවුන්ට තනිවම පානය කිරීමට නොහැකි නම් හෝ ප්‍රතිචාර නොදක්වන්නේ නම්,ඉක්මනින් ගිලන් රථයක් ගෙන්වාගැනීම සිදුකල යුතුය.

තොචිගි නගරයේ, තාප ආඝාතය වැළැක්වීම සඳහා, උණුසුම් දිනවල ජනතාවට පහසුවෙන් නතර වී තාවකාලිකව සිසිල් විය හැකි ස්ථාන "තාවකාලික සිසිලන ස්ථාන" ලෙස නම් කර ඇත. එවැනි ස්ථාන ලෙස ප්‍රධාන නගර ශාලාව, ප්‍රාදේශීය නගර ශාඛා කාර්යාල සහ ප්‍රජා මධ්‍යස්ථාන මෙන්ම සුපිරි වෙළඳසැල්, ෆාමසි, තැපැල් කාර්යාල සහ ෆැමිලිමාර්ට් කොම්බිණි වෙළඳසැල් වැනි ස්ථාන තාවකාලික සිසිලන ස්ථාන ලෙස භාවිතා කලහැක.
තවද, රජය විසින් "විශේෂ උස්ණත්ව අනතුරු ඇඟවීමක්" නිකුත් කර ඇති විට, ඔබට නගරය විසින් නම් කරන ලද "සිසිලන ස්ථානයකට" පැමිණිය හැක.

"තවකාලික සිසිලන ස්ථාන" සහ "සිසිලන නිවාස" යන සෑම ස්ථානයකම තොරතුරු පෝස්ටර් මගින් පළ කර ඇත. කරුණාකර එම එක් එක් ස්ථානවල සඳහන් නීති අනුගමනය කර ඒවා නිදහසේ භාවිතා කිරීමට හැක.ඉහත සඳහන් ස්ථාන භාවිතා කළහැකි කාලය ඔක්තෝබර් 21 දක්වා වේ.

## 2. "තොචිසුකෙි වවුචර් පත් 2026" බෙදා හැරීම පිළබදව

තොචිගි නගරයේ, පළාත් පාලන ආයතනවලට සහාය වීම සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් උපයෝගී කරගනිමින්, ආහාර සහ අනෙකුත් අවශ්‍යතා මිල ඉහළ ගොස් ඇති බැවින් නගරය එහි පුරවැසියන්ගේ ජීවිතවලට සහාය වීමත් සහ නගරය තුල ඇති වෙළඳසැල්වල ඇති භාණ්ඩ මිලදී ගැනීමට නගර වාසින් දිරිමත් කිරීමෙන් නගරයේ ඇති ව්‍යාපාරවලට සහාය ලබා දීම සහ පුනර්ජීවනය කිරීමේ අරමුණින්, සියලුම පුරවැසියන්ට යෙන් 6,000 ක් වටිනා "තොචිසුකෙි වවුචර් පත් 2026" නගරයේ සැම පුරවැසියෙක් වෙත ලබා දෙනු ලැබේ.

ඉහත  වවුචර් පත් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන්නන් වන්නේ අප්‍රේල් මස 15 වන දින වන විට තොචිගි නගරයේ පදිංචිකරුවකු ලෙස ලියාපදිංචි වී සිටින අය වේ. මෙය යෙන් 1,000 සේ වවුචර් පත් හයකින් සමන්විත වන අතර නගරය තුළ පවතින වෙළඳසැල්වල භාණ්ඩ මිලදීගැනීම සඳහා භාවිතා කළ හැකිය. මෙම වවුචර පත් වල වලංගු කාලය වන්නේ අගෝස්තු පළමුවන දින සිට ඔක්තෝබර් මස 31 දක්වා වේ.

මෙම වවුචර පත් ජූලි මස අග සිට සති පහක පමණ කාලයක් තුල ගෘහ මූලිකයින්ට ජපන් තැපැල් සේවාව මගින් බෙදාහරිනු ලැබේ. මෙම වවුචර පත් මුදල් වලට හා සමාන වටිනාකමක් ඇති බැවින්, ඒවා සෘජුවම අදාල පුද්ගලයාට ලාබදෙන පාර්සලයක් ලෙස ලැබෙනු ඇත.ඔබ නිවසේ නොමැති නම්, ඔබේ තැපැල් පෙට්ටියේ බෙදාහැරීමේ දැන්වීමක් තබනු ඇත, එබැවින් කරුණාකර නැවත ගෙන්වාගැනීමට හෝ තැපැල් කාර්යාලයෙන් ලබා ගැනීමට වග බලා ගන්න. බෙදාහැරීමේ දැන්වීමේ අවසාන දිනය ඔබ මග හැරියහොත්,මෙම වවුචර පත් වල ඇති වලංගු කාල සීමාව තුළ නැවත ඔබ වෙත ගෙන්වා ගැනීමේ හැකියාව නොලබීමටද හැකියාව ඇතිබව කරුණාවෙන් සලකන්න.

## 3. නම්කරන ලද කසල බෑග් නොමැති විට සිදුකලයුතු දෑ පිලිබඳව

දැනට ඇතිවී ඇති ජාත්‍යන්තර තත්ත්වයන් මත ඇති වූ අවිනිශ්චිතතාවය හේතුවෙන්, කසළ බෑග් මිලදී ගන්නා පුද්ගලයින් සංඛ්‍යාවේ හදිසි වැඩිවීමක් සිදුවී ඇත.

තොචිගි නගරය මගින් තීරණය කරනලද කසල බෑග් හිඟයක් පවතින අතර වෙළඳසැල් මගින් මිලදී ගැනීමට අපහසු තත්වයක් ඇතිවී ඇත.

නම් කරන ලද කසල බෑග් පහසුවෙන් ලබා ගත හැකි වන තුරු, සුපුරුදු ලෙස නියමිත කසල බෑග් භාවිතා කිරීමට අමතරව, ඔබට පහත ක්‍රම භාවිතා කර ඔබගේ  කසළ බැහැර කළ හැකිය. ඔබට නියමිත කසල බෑග් ලබා ගත නොහැකි නම් කරුණාකර පහත සඳහන් ආකාරයට කසල බැහැරකළ හැක.

කසල බෑගයේ වර්ණය විනිවිද පෙනෙන හෝ අර්ධ විනිවිද පෙනෙන විය යුතු අතර එමඟින් බෑගය තුල ඇති අන්තර්ගතය දෘශ්‍යමාන විය යුතුය.

කසල බෑගයේ ප්‍රමාණය දහනය කළ හැකි කසල(මොයසු ගොමි), ප්ලාස්ටික් බෝතල්(පෙත්තෝ බොතොරු)සහ සැකසූ ආහාර සඳහා භාවිතා කල තැටි(ස්යොකුහින් තොරේ ) සඳහා ලීටර් 45 දක්වා සහ හිස් කෑන්(අකි කන්) සහ හිස් බෝතල් (අකි බින් )සඳහා ලීටර් 30 දක්වා විය යුතුය.

බෑගයේ, කරුණාකර " සංගමයේ නම හෝ නගරයේ නම", ඔබේ "නම" සහ "කසළ වර්ගය" කළු පැහැති මාකර් පෑනකින් ලිව යුතුය. කසළ වර්ග ලිවීමේදී "දහනය කල හැකි කසල (මොයසු ගොමි)ලෙසද ", "ප්ලාස්ටික් බෝතල්/ආහාර තැටි"(පෙත්තෝ බොතොරු/ස්යොකුහින් තොරේ)ලෙසත් "හිස් කෑන්/හිස් බෝතල්"(අකි කන් /අකි බින් )ලෙස ලිවිය යුතුය.

නම් කරන ලද කසළ බෑග් වෙළඳසැල්වල මිලදී ගැනීමට පහසුවෙන් හැකි වන තෙක් ඔබට නම් කරන ලද කසළ බෑගය වෙනුවට වෙනත් බෑගයක් භාවිතා කළ හැකිය. මෙම කාල සීමාව අවසන් වීම නගරයේ පුවත් පත්‍රිකාවේ සහ එහි වෙබ් අඩවියේ නිවේදනය කරනු ලැබේ.